# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2398/41 - 2024 අගෝස්තු මස 23 වැනි සිකුරාදා - 2024.08.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

දැන්වීමයි

**මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියේ සංශෝධිත මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 10 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 53(1) වගන්තියේ (ආ) වගන්තියේ (ආ) ඡේදය යටතේ කරනු ලබන දැන්වීමයි**

ලියාපදිංචිය අවලංගු කර ඈවර කටයුතු සිදු කෙරෙමින් පවතින මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ පහත නම් සඳහන් සමුපකාර සමිතිවලින් එකී සමිති සමග ගණුදෙනු පැවැත් වූ සියලු සාමාජිකයින්, නිලධාරීන්, සේවකයින් සහ සාමාජික නොවන්නන් හා ආයතන වෙත අයවීමට ඇති මුදල් සම්බන්ධව හිමිකම් කැඳවනු ලැබේ. ඒ අනුව හිමිකම් ඉදිරිපත් කිරීම පහත දැක්වෙන ආකෘති පරිදි පිළියෙල කළ ඉල්ලුම්පත්‍රයක් මගින් සිදුකළ යුතු අතර එකී ඉල්ලුම්පත් 2024.11.23 වැනි දින හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් ඈවරකරු වෙත එවිය යුතුය. එසේ නැතහොත් පහත සඳහන් ලිපිනයේ දී හමුවී භාරදිය හැකිය. 2024.11.23 වැනි දිනට පසු ඉදිරිපත් කරනු ලබන හිමිකම්පෑම සම්බන්ධව සලකා නොබලන බව තවදුරටත් සඳහන් කර සිටිමි.

**අමිල නවරත්න,**
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර්,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
මධ්‍යම පළාත.

2024 අගෝස්තු මස 23 වැනි දින,
මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 02,
ඇහැලේපොල කුමාරිහාමි මාවත,
බෝගම්බර,
මහනුවර.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**හිමිකම් පෑම සඳහා ගැසට් කිරීම - නුවරඑළිය**

| *අනු. අංකය* | *සමිතියේ නම* | *ලි. ප. අංකය* | *ලි. ප. දිනය* | *ලි. ප. අවලංගු කළ දිනය* | *ඈවරකරුගේ නම* |
|---|---|---|---|---|---|
| 1 | සීමාසහිත කුඹල්ඔළුව රෙදි බෝනික්කන් හා ඇඟළුම් නිෂ්පාදනය කිරීමේ කර්මාන්තකරුවන්ගේ සමුපකාර සමිතිය | මපස 758 | 2005.09.28 | 2016.05.16 | ඩබ්. ඒ. සලින්ද නදීශ මයා |

**හිමිකම් ඉදිරිපත් කිරීමේ ඉල්ලුම්පත්‍රය**

01. සමිතියේ නම :- ...................................................................................................

02. හිමිකම් ඉල්ලුම්කරුගේ නම :- ...................................................................................................

03. ලිපිනය :- ...................................................................................................

04. සාමාජිකයෙකු නම් සාමාජික අංකය :- ...................................................................................................

05. සාමාජිකත්වය ලැබුණු දිනය :- ...................................................................................................

06. අයවීමට ඇති මුදල :- ...................................................................................................

07. අයවීමට ඇත්තේ කුමන කරුණක් සඳහා ද යන වග :- ...................................................................................................

08. හිමිකම් ඉදිරිපත් කරනුයේ කවුරුන් වශයෙන් ද යන වග (සාමාජික/ නිලධාරි/ සේවක/ වෙනත්) :- ...................................................................................................

09. හිමිකම් තහවුරු කිරීමට ඉදිරිපත් කෙරෙන ලියවිලි :- ...................................................................................................

දිනය -

ඉල්ලුම්කරුගේ අත්සන :- ...................................................................

ඈවරකරු :- ...................................................................

EOG 08 - 0267